**ශීර්ෂය - 273, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ මෙම වාර්ථාවේ 3.7 (එ), 3.6 (ඇ) ,3.7 (ඒ), 2.4.(1) (ඇ) සහ 3.7 (අ), සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/GFS/01/01/08 – Volume දරන 2022 දෙසැම්බර් 20 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු හඳුනාගත් ඉඩම් සහ ගොඩනැඟිලි තක්සේරු කරවා ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු බවට හඳුනාගත් ග්‍රාම නිලධාරී කාර්යාල 47, නිල නිවස 08 රජයේ පොදු ගොඩනැඟිලි 13ක් හා ප්‍රජා ශාලාවක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකම ලබාගැනීමෙන් පසු 2023 වර්ෂය තුළ ගිණුම්ගත කිරීමට සැලසුම් කලද එම ඇස්තමේන්තු වටිනාකම් නොලැබීම මත ගිණුම්ගත කිරීමට නොහැකි විය. | තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ට අයත් විධායක සහ විධායක නොවන එකතුව වර්ග අඩි 17,317 ක් වූ නිල නිවාස 14 ක් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකම ලබාගැනීමෙන් පසු 2023 වර්ෂය තුළ ගිණුම්ගත කිරීමට සැලසුම් කලද එම ඇස්තමේන්තු වටිනාකම් නොලැබීම මත ගිණුම්ගත කිරීමට නොහැකි විය. | තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (iii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 මඟින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට දීර්ග කාලීන බදු ලබා දී තිබූ එකතුව ආසන්නව අක්කර 3387 ක් වූ ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | රජය සතු ඉඩම් ප්‍රාදේශීය ලේකම් භාරයේ පැවතිය ද එකී ඉඩම් ප්‍රාදේශීය ලේකම්ගේ වත්කමක් වශයෙන් ගිණුම්ගත කිරීමට අවශ්‍ය නොවන බැවින්, ගිණුම්ගත නොකරන බව දන්වමි. | ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (iv) | ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණු ට්‍රැක්ටර් හා බවුසර් 08, වතුර මෝටර් 04ක් වතුර ටැංකි 08, බෝට්ටු හා එන්ජින්මක්, ජීවිතාරක්ෂක කබා 18ක්, මෙගා ෆෝන් 01ක් හා ජීවිතාරක්ෂක කඹ 01 ක් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ආපදා කළමනාකරණ ඒකකය මඟින් පිරිවැය වටිනාකම ලබාගෙන මේ වසර තුළ නිම කිරීමට අපෙක්ෂා කරමි. ට්‍රැක්ටර් හා බවුසර් පුත්තලම දිස්ත්‍රික් ලේකම් වෙත පවරාගත් පසු ගිණුම්ගත කරන බව දන්වමි. | වත්කම්වල පිරිවැය ලබාගෙන ගිණුම්ගත කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| **(v)** | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ ලොරි බවුසර් 09 ක්ද පවරා ගෙන ගිණුම් ගත කර නොතිබුණි. | ලොරි බවුසර් පවරාගැනීමෙන් පසු ගිණුම්ගත කිරීමට ක්‍රියා කරමි. | වත්කම් පවරාගෙන ගිණුම්ගත කළයුතුය. |
| **( ආ)** | **නොසැසඳූ ගිණුම්** | | |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයේ වැය ලෙජරය සහ භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව වැය විෂයයන් 12 ක එකතුව රු. 159,402,469ක නොසැසඳීම් නිරීක්ෂණය විය. | වැය ලෙජරය නිවැරදි කරන ලෙස විෂය ලිපිකරු දැනුවත් කරන ලදි. | වැය ලෙජරය සහ භාණ්ඩාගාර පරිගණක සටහන් මාසිකව සසඳා නොසැසදීම් නිරවුල් කර ගැනීමට කටයුතු කර යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අධි ඇස්තමේන්තු සකස් කිරීම | | |
| මු.රෙ.50 අනුව ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණ ලෙස හා නිවැරදිව සකස් කළයුතු බව දක්වා තිබුණ ද, වැය විෂය 1403 විදුලිය හා ජලය සඳහා වර්ෂ ගණනාවක සිට අධි ඇස්තමේන්තු සකස් කරනු ලබන බව නිරීක්ෂණය වූ අතර 2023 වර්ෂයේ ඉතිරිය රු.6,710,715 ක් හෙවත් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 34 ක් වී තිබුණි. | 2023 වර්ෂයට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කිරීම 2022 සැප්තැම්බර් මස සිදුකරන ලදි. ඒ වන විට විදුලි බිල වැඩි කිරීමේ යෝජනාවක් විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරමින් සිටි බැවින් වැඩිවේයැයි අපේක්ෂිත විදුලි බිලට අනුකූලව ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරන ලදි. ඒ අනුව විදුලිය අධි ඇස්තමේන්තු වීමක් සිදුව ඇත. | මු.රෙ.50 අනුව ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණ ලෙස හා නිවැරදිව සකස් කළයුතුය. |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මියගිය නිලධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු.464,855ක් ද, විශ්‍රාමගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.591,409 ක් ද, වැඩ තහනම් කර තිබූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු.401,619 ක් ද, සේවය අතහැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.513,405 ක් වූ වශයෙන් එකතුව රු.1,971.288 ක සේවක ණය ශේෂයක් | නිලධාරින් 04 දෙනෙකුගේ ණය ශේෂ මේ වනවිට ගෙවමින් පවතින අතර විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ ගිණුම් සාරාංශ මඟින් හා විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර | ණය ශේෂ නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

| | | |
|---|---|---|
| අයකර ගත යුතුය තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වනවිට වසර 01ත් 15ත් අතර කාලයක සිට පැවත එමින් තිබුණ මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැනීමටත් අනෙක් ණයශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගැනීමටත් කටයුතු කරමින් පවතී. | |

**2.3** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) i. | කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙළුම් ගම්මානයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ දී රු.6,988,313ක් වැයකර ගොවීන් 40 ක් සඳහා දෙළුම් පැළ, පොහොර හා ජල සම්පාදන උපකරණ ආදී වශයෙන් එක් ගොවියෙකුට රු.200,000 කට ආසන්න ප්‍රතිලාභ ලබාදී තිබුණු අතර තරුණ ප්‍රජාව කෘෂි කර්මාන්තයට ආකර්ෂණය කර ගැනීම මූලික අරමුණක් වුවද, තෝරාගෙන සිටි සියලුම ගොවීන් ව්‍යාපෘතිය ආරම්භ කරන දින වනවිටත්, වානිජ මට්ටමින් ගොවිතැන් කටයුතුවල නිරත පිරිසක් විය. | කෘෂිකර්මාන්තය කෙරෙහි හා නවීන කෘෂි තාක්ෂණික විධික්‍රම පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික අවබෝධයකින් යුත් ගොවීන් තෝරා ගැනීම වඩාත් සුදුසු බැවින්, එවන් ගොවීන් පිරිසක් තෝරා ගැනීම සිදුකරන ලදි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු බව හා රජය අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළයුතුය. |
| ii. | "රෙඩ් ඒන්ජල්" දෙළුම් ප්‍රභේදය මෙම ප්‍රදේශයට යෝග්‍යතාවය තහවුරු කර ගැනීමෙන් තොරව තෝරාගෙන තිබුණු අතර පිරිවිතරයන්ට අනුව ලේයර් පැළ සැපයිය යුතු වුවත්, නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවූ පැළ සපයා තිබූ බැවින් 2024 පෙබරවාරි 15 දින වනවිට රු.450 ක් බැගින් මිලදී ගත් පැළ 7400 කින් රු.1,535,850ක් වටිනා පැළ 3413 ක් මියගොස් තිබුණි. | කල්පිටියේ පවතින දේශගුණික හා කාලගුණික සහ පාංශුමය තත්ත්වයන් මත අදාල දෙළුම් ප්‍රභේදය ඉතා සාර්ථකව වගා කළහැකි දෙළුම් ප්‍රභේදයක් ලෙස ගොවීන් විසින් හඳුනාගෙන තිබේ. | නිසි ප්‍රමිතියෙන් යුක්ත ලේයර් පැළ ද යන්න නිලධාරීන් විසින් පරීක්ෂා කර භාරගත යුතුය. |
| iii. | ප්‍රතිලාභීන් 40ක් සඳහා ජල මෝටර්, නළ ලිං සහ විසුරුම් ජල සම්පාදන පද්ධති මිලදී ගැනීමට රු. 3,314,000 ක් වැයකර තිබුණ ද එම උපකරණ ඌන උපයෝජිතව පැවතුණි. | ප්‍රදේශයේ පවතින උෂ්ණාධික තත්ත්වය මත විශාල ජල ප්‍රමාණයක් ලබාගත යුතු බැවින්, එක් එක් වගාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ජලය ලබා ගැනීමට නළ ලිං ඉදිකල යුතුව ඇත. | ව්‍යාපෘති අරමුණ ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 වර්ෂයේ දී වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වේවැල් රක්ෂිතය තුළ අක්කර 15 ක වේවැල් පැළ සිටුවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,973,994 ක් වියදම් කර තිබුණු අතර මිනිස් දින 465 කට රු.790,500 ක් හා වේවැල් පැළ 5250 ක් මිලට ගැනීම සඳහා රු.630,000 ක් ගෙවා තිබුණ මුත් පැළ වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නිලධාරීන් වැඩබිමේ සිට අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මිනිසුන් විසින් ගිනි තබා විනාශ කරන ලද භූමිය වේවැල් රක්ෂිතයක් බවට පත්කිරීම සඳහා අක්කර 15ක භූමි ප්‍රමාණයක වේවැල් පැළ සිටුවා මේවන විට එය ස්වභාවික වේවැල් රක්ෂිතයක් බවට පත්වෙමින් පවතී. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් කරන ලද මුදල රු.1,973,994 ක මුදල නිශ්කාර්ය වියදමක් නොවන අතර එය අනාගත පරිසර තිරසරභාවය සහ ආර්ථික තිරසරභාවය සඳහා මහත් පිටුවහලක් වන ව්‍යාපෘතියක් ලෙස සඳහන් කළ හැකිය.<br>ශ්‍රම කුලිය මිනිස් දින 465 කට රු.790,500 ක මුදලක් සහ වේවැල් පැළ5250 ක් මිලට ගැනීම සඳහා රු.630,000ක මුදලක් වියදම්කර ඇති අතර නිරවද්‍යතාවයන් වැඩ බිමේ සිට සහ වීඩියෝ තාක්ෂණය හරහා නිරීක්ෂණය කරන ලදි. | ව්‍යාපෘතිය කාර්යක්ෂමව අරමුණු ඉටුවන ආකාරයට ඉටුකරවා ගැනීමට හා අධීක්ෂණයක් කළ බවට සාක්ෂි සාධක සහිතව ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| | (i.) II බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය | 2,569,682 | "විගණන වාර්තාවක් මඟින් කිසියම් නිලධාරියෙකු විසින් කර තිබෙන අක්‍රමිකතාවයන් හෝ විෂමාචාරයන් පෙන්වා දී ඇති විට විධිමත් විනය පියවර ගතයුතු වුවත්, ආණමඩුව ප්‍රාදේශීය | මේ සම්බන්ධයෙන් වන සියළුම වාර්තා විනය කටයුතු සිදු කිරීම සඳහා විනය බලධාරියා වෙත යොමු කර ඇත. නැවතත් 2024.04.08. දිනෙන් සිහිකැඳවීමේ ලිපියක් යොමු කර ඇත. | විධිමත් විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරියෙකු අධි ඇස්තමේන්තු සකස් කිරීමේ චෝදනාව මත චෝදනා පත්රයක් නිකුත් කර අවුරුදු 02 ක් පසුවී තිබුණ මුත් ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් විනය බලධාරියා විසින් ගෙන නොතිබුණි. | | |
| (ii) II බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය 13. හා 12 උප වගන්තිය | -- | සැකයට පාත්‍ර වූ නිලධාරියාට එරෙහිව විනයානුකූලව ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් චෝදනාවන් හෙළිදරව් වන්නේ නම් චෝදනාපත්‍ර කෙටුම්පතක් සකස් කර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීමට මූලික විමර්ශන නිලධාරී විසින් කටයුතු කළයුතු අතර 14 වන වගන්ති ප්‍රකාරව විනය බලධාරියා විසින් චෝදනා පත්‍රයක් නිකුත් කිරීම කළයුතු වුවත්, අවස්ථාවන් 05 කදී එසේ කටයුතු කර නොතිබුණි. | එක් නිලධාරිනියක් සම්බන්ධයෙන් මේ වන විට විධිමත් විනය පරීක්ෂණය අවසන් කර වාර්තාව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. විනය නියෝගයක් නිකුත් කිරීමේදී නිලධාරින්ගේ අතීත රාජකාරි වැඩ පිලිබදවද සොයා බැලීමක් සිදු කරන බැවින් ඒ සඳහා යම් කාලයක් ගතවේ.<br><br>අනෙක් නිලධාරියා සම්බන්ධයෙන් පැමිණිල්ල මෙහෙයවන නිලධාරි විසින් චෝදනා පත්‍රය සංශෝධනය කිරීමට ඉල්ලා සිටීම හේතුවෙන් විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීම ප්‍රමාද වී ඇත. මේ වන විට චෝදනා පත්‍රය සංශෝධනය කර විධිමත් විනය පරීක්ෂණය සිදු කරමින් පවතී. | විධිමත් විනය පරික්ෂණ කටයුතු කඩිනමින් සිදුකර අවසන් කළයුතුය. |
| (iii.) II බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය 21.1 උප වගන්තිය | -- | විධිමත් විනය පරික්ෂණයක විනිශ්චය සභාවක් ලෙස පත්කරනු ලැබූ නිලධාරියෙක් විසින් විධිමත් විනය පරික්ෂණයක් පවත්වා නොපමාව පරික්ෂණ වාර්තාව විනය බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, චෝදනා පත්‍ර නිකුත් කර වසර 01 කට වැඩි කාලයක් විනය පරික්ෂණ කටයුතු සිදුකරමින් තිබූ අවස්ථා | මේ වන විට විනිශ්චය සභාව පත් කර ඇත. | විධිමත් විනය පරික්ෂණ කටයුතු කඩිනමින් සිදුකර අවසන් කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 02 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | |
| (iv.) II බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය 22.2 උප වගන්තිය | 546,992 | විනය පරීක්ෂණයක් සඳහා රජයට ගෙවීමට සිදුවන වියදම් අවම කර ගැනීමට නිසි පියවර ගැනීම විනය බලධාරියාගේ වගකීමක් වන නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වා හා පවත්වාගෙන යමින් තිබෙන විනය පරිකෂණ 07 ක් සඳහා වසරකට වැඩි කාලයක් ගත කර තිබු අතර, 2023 දෙසැම්බර් 31 දිනට රු.546,992 ක වියදමක් දරා තිබුණි. | මෙ සම්බන්ධ සියළු වාර්තා විනය බලධාරියා වෙත යොමු කර ඇත. නැවතත් සිහිකැදවීමේ ලිපියක් 2024.04.08 දින යොමු කර ඇත. | විධිමත් විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් සිදුකර අවසන් කළයුතුය. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| (i.) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛ යේ 02(iv) වගන්තිය | 1,407,649 | වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් සනාථ කළයුතු වුවද, ඒ අනුව කටයුතු නොකරමින් පුත්තලම සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් හට නිවාඩු දින රාජකාරී වැටුප් ගෙවා තිබුණි. | විගණනය පෙන්වා දුන් අඩුපාඩු නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව දන්වමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ii) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය | -- | දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් වසර 05 ක් එකම සේවා ස්ථානයක සේවය කර ඇත්නම් ස්ථාන මාරු කිරීමට පියවර ගතයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි නිලධාරීන් | චක්‍රලේඛ උපදෙස් පරිදි ස්ථාන මාරුවීම් සඳහා දැනුම් දි ඇති අතර ඉන් කොටසකට පමණක් ස්ථානමාරුවීම් ලැබී ඇත. වාර්ෂිකව වසර 05 ඉක්මවූ සේවකයන් පිළිබඳව වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කරමින් කලයුතු | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ස්ථාන මාරුවීම් සිදුකළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 355 දෙනෙකු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | මූලික කර්තව්‍යයන් ඉටුකර ඇති බවත් දන්වමි. | |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය | -- | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළයුතු බව දක්වා තිබුණද, එසේ සිදුකර නොතිබුණි. | විගණනය පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කරගැනීමට නිලධාරින්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කළයුතුය. |
| (ඇ) | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOD/CSD/ REPORT/1/ CIRCULAR (2023) දරන 2023.09.19 දිනැති අංක 2023/04 චක්‍රාල්බයෙහි 12.1 වගන්තිය | -- | නියමිත කාලසීමාව තුළ ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම පැහැර හරින ගිනි අවි බලපත්‍රලාභීන් සම්බන්ධ තොරතුරු ගිනි අවි ආඥා පනත යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල කොට්ඨාශභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් මඟින් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කල යුතු වුවද. පුත්තලම දිස්ත්‍රික්කය තුළ 2024 වර්ෂය වනවිට ලබාදී තිබූ ගිනි අවි 1808 න් බලපත්‍ර ලබා නොගත් අනවසර ගිනි අවි 763 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම බලපත්‍ර අලුත් නොකරන ලද ගිනිඅවිවලින් යම්කිසි ප්‍රමාණයක් පොලිස් ස්ථාන වෙත තාවකාලිකව භාර දී ඇති බවක් නිරික්ෂණය වු හෙයින් එම ගිනිඅවි ස්ථිර ලෙසම රජයට භාර ගන්නා ලෙසත්, ස්ථිර ලෙස භාරගත් ගිනිඅවි සියල්ලෙහි තොරතුරු පොලිස් ස්ථානවල රඳවා ඇති ගිනිඅවි සම්බන්ධ තොරතුරු අප වෙත එවන ලෙස සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය කටයුතු කළයුතුය. |

**2.5** **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය අතර කාලය තුළ කරුවලගස්වැව, ආරච්චිකට්ටුව, මුන්දලම, මාදම්පේ සහ නවගත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අයත් එකතුව අක්කර 840.8 යි රූඩ් 144යි පර්චස් 94 කින් යුතු ඉඩම් කැබලි 37 | ඉඩම් දීර්ඝකාලිනව බදු ලබා දිම ප්‍රාදේශිය ලේකම් විසින් පමණක් සිදුකරන කර්තව්‍යයක් නොවන අතර ඒ සඳහා රාජ්‍ය ආයතන රැසකින් ඉටුවිය යුතු කාරණා ඇත. එම එක් එක් ආයතනය සමග සිදුවන රාජකාරි අතර යම්කිසි | රජයට අයත් ඉඩම් බදු දීම හා බදු ආදායම් අයකර ගැනීම කාර්යක්ෂමව සිදු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් සඳහා බදුකර සකස් කිරීමේ කටයුතු වර්ශ ගනනාවක සිට ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයෙන් ප්‍රමාද වෙමින් පැවතුන බැවින් එම ඉඩම් කැබලි බාහිර පාර්ශවයන් විසින් රජයට කිසිදු ගෙවීමක් සිදු නොකොට වානිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා භුක්ති විදින බව නිරීක්ෂණය වූ අකර ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු මන්දගාමී වී තිබුණි. | ප්‍රමාදයක් දැකිය හැකි අතර එම ප්‍රාදේශිය ලේකම්වරුන්ට සෘජුවම වගකීමේ හැකියාවක් නැත. | |
| (ආ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රත්තලම නගර සීමාව තුළ පිහිටි රූඩ් 02 යි පර්චස් 22 කින් යුත් අශෝක සිනමාහල පිහිටි ඉඩම 2014 වර්ෂයේ සිට නව බදුකරු වෙත වසර 30ක් සඳහා බදු ලබාදී තිබූ අතර, 2011 වර්ෂයේ සිට 2021 දක්වා අයවිය යුතු එකතුව රු.25,000,000 ක් වූ බදු මුදල් කපාහැර තිබුණි. | බදු මුදල් කපා හැරීමට ඉඩම් ඇමතිතුමාගේ අනුමැතිය 2021.08.18. දින ලැබී ඇති බව 2021.08.19 දින ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 4/10/12226 ලිපිය මගින් දන්වා ඇත. මෙම බදු කපා හැරීම පිළිබඳ ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් උපදෙස් අනුව කටයුතු කරමි. | රජයට අයත් ඉඩම් බදු ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු බදු ආදායම අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලරථය අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කිරීමනිසා 2023 අප්‍රෙල් 06 දින සිට 2023 ජුනි 16 දක්වා වූ කාලය තුළ සංචිත වාහනය සඳහා රජයේ වියදමින් රු.142,975 ක ඉන්ධන භාවිතා කර තිබුණ අතර තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ඉහත මාස 03 සඳහා රු.155,925 ක් ලබාගෙන තිබුණි. අංක 11/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව ඉන්ධන දීමනාවට අමතරව ඉන්ධන වෙනුවෙන් වැය කල රු.142,975 ක මුදලින් රු.51,150 ක් ආපසු ගෙවූ බව ඉතිරි රු.91,825 ක මුදල පියවීමට කටයුතු කර නොතිබුණි. | සංචිත වාහනය ප්‍රාදේශිය ලේකම් විසින් භාවිතා කරන අවස්ථා සඳහා ඇය විසින් වාහනයේ ඉන්ධන වියදම අතින් දරා ඇත.ඒ අනුව 2023 අප්‍රේල් ඉන්ධන දීමනාව ලබා ගැනිමට හිමිකම ඇත. මැයි මාසය සඳහා ඇය සංචිත වාහනය භාවිතා කල අවස්ථාවලදි ඇය විසින් ඉන්ධන යෙදිමක් සිදු නොකල බැවින් මැයි මාසයට හිමි ඉන්ධන දීමනාව ඇය ආපසු රජයට බැර කර ඇත. ජුනි මස 06 හා 23 යන දිනයන්හි සංචිත වාහනයට ඉන්ධන යෙදිමෙන් අනතුරුව ඇය එම වාහනයට භාවිතා කර ඇත. නිල රථය අළුත්වැඩියා කර භාරදුන් පසු ජුනි මාසයට අදාළ ඉන්ධන දිමනාව ලබා ගෙන ඇත. ජුනි මාසයේ ඉන්ධන දීමනාව ලබා ගැනිමට හිමිකම ඇති බැවින් එය ලබාගෙන ඇත. තවදුරටත් පියවීමට මුදලක් නැති බව කාරුණිකව දන්වමි. | වැඩිපුර ගෙවීම් අදාල නිලධාරියාගෙන් අයකර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) (i.) | 2019 - 2021 කාලය තුළ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදී ගැනීමට 2020/21 මහ හා 2021 යල කන්නවලදී ආණමඩුව, නවගත්තේගම හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වී මෝල් හිමියන් 20 දෙනෙකු වෙත ලබාදුන් මුදල්වලින් ලංකා ස.තො.ස. වෙත 2022 මාර්තු 15 දිනට ලැබිය යුතු සහල් කිලෝග්‍රෑම් 1429338 ක් වෙනුවෙන් රු.111,208,565 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි. තවද, රජයේ පරමාර්ථය වූ ගොවියාගේ අතිරික්ත වී තොගය සාධාරණ මිලකට ලබා ගැනීම හා සතොස මගින් පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට සහල් ලබාදීම යන පරමාර්ථ ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. | ලබාදිය යුතු සහල් වල මූල්‍ය අගය රජයට ගෙවන ලෙස ලබා දුන් තීන්දුව මත කොටස් වශයෙන් මුදල් ගෙවීම සිදුකල අතර 2024.04.30 දින වන විට තවදුරටත් අයවිය යුතු මුදල රු.106,773,565.39න් එම මුදල අයකර ගැනිම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි. | මුදල් අයකර ගැනීමට කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ii) | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ 2021 පෙබරවාරි 25 දිනැති ලිපියට අනුව කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීගේ නිර්දේශය නොසළකා ගොවිජන සේවා කාරක සභා විසින් සකස් කර ඇති පොහොර නාම ලේඛන ඇසුරෙන් වගාකල කුඹුරු අක්කර ගණන නිශ්චය කර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් හට දන්වා තිබුණ ද, නවගත්තේගම හා ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් එම අවශ්‍යතාවය ඉටුනොකර 2021 යල කන්නයේ දී පොහොර නාම ලේඛනවල නම සඳහන් නොවූ පුද්ගලයින් 142 දෙනෙකුගෙන් වී කිලෝ 710,000 ක් සඳහා මිලදී ගත් බවට ලේඛන සකස් කර රු.31,240,000 ක් ගෙවා තිබුණි. | මෙම වී මිලදි ගැනිමේ වැඩසටහන ක්‍රියාත්මක වන අවස්ථාවේ කෘෂි පර්යේෂණ නිලධාරින් වෘත්තිය ක්‍රියාමාර්ගයකට එළැඹීම නිසා පොහොර නාම ලේඛනය පරික්ෂා කර වී මිලදි ගැනිමට උපදෙස් දුන්නද කඩිනමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කල යුතුව පැවතිම හේතුවෙන් එවකට සිටි කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් වී සපයන තැනැත්තන්ගෙන් තමා ගොවියකු බව ප්‍රකාශ කරන ලද ලිපියක් ලබාගෙන වි මිලදි ගන්නා ලෙස වාචිකව ප්‍රාදේශිය ලේකම්වරුන්ට උපදෙස් ලබා දීම හේතුවෙන් ඒ අනුව ක්‍රියා කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (iii) | 2021 යල කන්නයට අදාල වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ ගොවි නාම ලේඛනයේ නම් සඳහන් ගොවීන් 11 දෙනෙකු විසින් ලබාදුන් ලිඛිත ප්‍රකාශවලට අනුව කිසිදු වී ප්‍රමාණයක් වී මෝල් හිමියන් වෙත ලබාදී නොතිබිය දී වී කිලෝ ග්‍රෑම් 55,000 ක් සඳහා රු.2,420,000 ක් ගොවීන්ගේ | වී මිලදි ගැනිමේ ක්‍රියාවලිය තුල වංචාවක් හෝ වැරදිමක් සිදු නොවන ආකාරයට සියළුම කටයුතු සැලසුම් කල අතර එම කටයුතු හොඳින් අධීක්ෂණය කිරිම සඳහා කෘෂිකර්ම අංශයේ සංවර්ධන නිලධාරින්ට අමතරව අදාළ ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන | චක්‍රලේඛ උපදෙස් පරිදි බලධාරීන් විසින් නිසි අධීක්ෂණය කරමින් කටයුතු කළයුතුය. |

| | |
|---|---|
| ගිණුම්වලට බැරවූ පසු එම මුදල ගොවීන් විසින් මෝල් හිමියන් වෙත ලබා දී තිබුණි. තවද නවගත්තේගම කොට්ඨාසයේ ගොවීන් 14 දෙනෙකුගෙන් වී කිලෝ ග්‍රෑම් 5000 බැගින් එකතුව කිලෝ ග්‍රෑම් 70,000 ක් ලබාගත් බවට පත්‍රිකා සකස් කරමින් ගොවීන්ගේ ගිණුම්වලට රු. 3,180,000 ක් බැරකර තිබුණද, ගොවීන්ගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශවලට අනුව ඔවුන් ලබාදී තිබුණේ වී කිලෝ ග්‍රෑම් 28000 ක් පමණක් වූ අතර වෙනස වූ වී කිගෝ ග්‍රෑම් 42000 ක මුදල වන රු.1,848,000 ක් මෝල් හිමියන් විසින් ගොවීන්ගෙන් ආපසු ලබාගෙන තිබුණි. | නිලධාරින්ට වී මිලට ගන්නා අවස්ථාවල වී මෝල තුල රැදී සිටින ලෙසට උපදෙස් ලබා දී තිබුණි. ඔවුන්ද එලෙස කටයුතු කර තිබුණි. වී මිලදී ගැනීමේදී මිලදී ගත් ප්‍රමාණ තහවුරු කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ආකෘති පත්‍ර 03 ක් හඳුන්වා දී තිබුණි. ඒ අනුව එක් එක් ආකෘති පත්‍රය නිවැරදිව පුරවා සකස් කිරීමට නිලධාරින්ට රාජකාරි පවරා දී තිබුණි. එලෙස ලැබෙන ලියවිලි වල නිරවද්‍යතාවය තහවුරු කරගෙන ප්‍රාදේශීය ලේකම් විසින් ගෙවීම් කටයුතු කරන ලදි.ඒ අනුව ව්‍යාජ බලපත්‍ර සැකසීම අදාළ පාර්ශව සන්ධානගතව සිදුකර තිබුණා විය හැකි නමුත් අදාළ වී ප්‍රමාණය මෝලට භාරදුන් බවට අදාළ ගොවියන් විසින් අදාළ ආකෘතිපත් අත්සන් කර ලබා දී ඇත.මේ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනිම කෙරෙහි මේ වන විට අවධානය යොමුකර ඇත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එක් එක් අංශ විසින් ළඟා කරගත යුතු ඉලක්ක දැක්වෙන ක්‍රියාකාරී සැලැස්මක් 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණ ද, ළගා කරගත් ඉලක්ක හෙවත් ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් පිළියෙල කර නොතිබීම හේතුවෙන් එම සැලැස්මේ දැක්වුණු සියලුම ඉලක්ක ළඟා කරගත්තේ ද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය. | ක්‍රියාකාරි සැලැස්ම අදාළ එක් එක් ක්‍රියාකාරකම්හි ප්‍රගතිය දැක්වෙන වාර්තා එක් එක් ක්‍රියාකාරකම සිදුකරන නිලධාරින් වෙත ඇති අතර ඒකාබද්ධ ප්‍රගති වාර්තාවක් සකස් කිරීම අතපසු වීමකින් සිදුව නැත.ඉදිරියේදී ඒකාබද්ධ ප්‍රගති වාර්තාවක් සකස් කරන ලෙස නිලධාරින් දැනුවත් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුරූපව ඉටුකරන ලද කාර්යයන් තුලින් ලඟාකර ගත් ඉලක්ක දැක්වෙන ප්‍රගති වාර්තාවන් සකස් කිරීමට කටයුතු කළයුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ දී ගම්පෙරළිය වැඩසටහන යටතේ එකතු වටිනාකම රු.84,152,801 ක් වියදම් කර ක්‍රියාත්මක කර තිබුණු පානීය ජල ව්‍යාපෘති 09 ක් එම | ව්‍යාපෘති සඳහා මේ වන විට පුත්තලම දිස්ත්‍රික් ප්‍රජා ජල සැපයුම් ඒකකය විසින් සැලසුම් කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතියි. මේ වන විට කෝන් ගස් යාය ග්‍රාමයේ පානිය ජල ව්‍යාපෘතියේ වැඩ | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉදිරි මූල්‍ය පහසුකම් නොලැබීම මත ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම වෙනුවෙන් යොදා නොගෙන වර්ෂ 4 කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | අවසන් කර ඇති අතර, ඉතිරි ව්‍යාපෘතිවල වැඩ සිදුකරමින් පවතියි. | |
| (ආ) | 2022 වර්ෂයේ අයවැය යෝජනා තුළින් ඉදිරිපත් කළ “ගම සමඟ පිළිසඳරක් ” ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතු වටිනාකම රු.3,357,861 ක් වියදම් කර ඉදිකර තිබුණු “සේවා පියස” ගොඩනැඟිලි 04 ක්, බහුකාර්ය ගොඩනැඟිලි 02ක් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉදිරි මූල්‍ය පහසුකම් නොලැබීම මත එම ව්‍යාපෘති 06 හිම ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. | ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ගැනිම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා දෙන ලෙස ඉල්ලා 2023.11.07 දින ගරු ස්වදේශ කටයුතු හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා වෙත හා ලේකම් ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇත. | - එම - |
| (ඇ) | 2022 වර්ෂයේ දී නවගත්තේගම ප්රාදේශීය ලේකම් කොට්ඨාශයේ තම්මැන්නාවැටිය විහාරස්ථානය ඉදිරිපිට ශරීරසුවතා මංතීරුව ඉදිකිරීමට රු.894,311 ක මුදලක් වියදම් කර තිබුණ මුත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වල්බිහිවී තිබුණි.. | ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස යෝජනාවූ ව්‍යාපෘතියකි. ශරිර සුවතා මංතීරුව ඉදිකල අවධියේ නිරන්තර භාවිතයට ගත් අතර වැසිකාලවලදී භාවිතය අවම වන අවස්ථාවල වල් බිහිවූ තත්වයන්ද ඇති විය. | මහජනතාවගේ මූලික අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය ලබාදී ව්‍යාපෘති තෝරාගත යුතුය. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2014 – 2019 අතර කාලය තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 10 ක් සඳහා එකතු වටිනාකම රු.6,692,719 කට වැඩි මුදලක් වියදම් කර තිබුණු අතර එම ව්‍යාපෘති 10 ම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වර්ෂ 4 ක සිට වර්ෂ 9 ක් දක්වා කාලපරායක් ඉක්ම ගොස් තිබුණි ද, එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණු අතර එකතුව රු.3,350,849 ක් වියදම් කර ඉදිකිරීම් ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 04 ක කටයුතු අතරමඟ නවතා දමා නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිවල වැඩ නිම කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහාය වන ලෙස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව, පළාත් පාලන ආයතනය හා රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලබාගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. එසේම 2024 දී විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර ඇත. | අක්මුදල් ලබාගෙන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2016 සිට 2019 දක්වා කාලය තුළ රු.4,965,000ක මුදලක් වියදම් කර ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 08ක් නිම නොකර අත්හැර දමා තිබුණි. | අදාල සුභසාධන සමිති හා දේශපාලන අධිකාරිය දැනුවත් කර ඇති අතර, අනෙකුත් ව්‍යාපෘති 2024 දී විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර ඇත. | අක්මුදල් ලබාගෙන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළයුතුය |

**3.4 ප්‍රසම්පාදනයන්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැඟිල්ල සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ලෙහි ඉතිරි වැඩ නිමකිරීමට අදාලව ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයට අතිරේක අංක 32 ට අනුකූල නොවන පරිදි එක් දිනක් පමණක් සහ සාමාන්‍ය රාජකාරී වේලාව තුළ රැස්වී තිබුණු ප්‍රසම්පාදන කමිටු වෙනුවෙන් නිලධාරීන් 09 දෙනෙකුට දීමනා ලෙස එකතුව රු.99,000 ක් ගෙවීම් කර තිබුණි. | දීමනා ලැබීමට නම් සාමාන්‍ය රාජකාරි යට බාධා නොවන පරිදි ප.ව.3 න් පසුව රැස්වීම් පැවැත්විය හැකි බව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2017 (1) ii ඡේදයේ සඳහන් වේ. සාමාන්‍ය තත්වයතුල අවම වශයෙන් රැස්වීම් 04 ක් වත් පවත්වන නමුත් රැස්වීම් වාර්තාවක් සකස් කර ඇත්තේ ප්‍රසම්පාදන තීරණ ගත් රැස්වීම් සඳහා පමණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අතිරේක අංක 32 ප්‍රකාරව කටයුතු කලයුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2024 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාව සපයා ගැනීමට අදාල ආයතනය තෝරාගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 හි දැක්වෙන විස්තර ඇතුළත් දැන්වීමක් ආයතනයේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යක පළකර නොතිබුණි. | විගණනය පෙන්වා දුන් ආකාරයට ක්‍රියා කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවන හා ආදර්ශ දෙළුම් වගාවක් සැපයුම්කරු සතුව නොතිබිය දී ග්‍රීන් ලංකා ෆාම් ආයතනය සැපයුම්කරුවෙකු ලෙස තෝරා ගැනීමේ පදනම පැහැදිලි නොවූ අතර එම ආයතනය තෝරා ගැනීමේ දී දෙළුම්පැළ සැපයීමේ ධාරිතාවය පිළිබඳව ද අවධානය යොමු කර නොතිබුණි. | මෙම ආයතනය සම්බන්ධව කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය මගින් තොරතුරු ලබාගත් අතර එහෙයින් අනෙක් පැල තවාන් මෙන් මෙම ආයතනය වෙතින්ද ලියාපදිංචි තැපැල වෙතින් ලංසු කැඳවන ලදි.තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් අදාළ පැල තවානෙහි ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ අතර එම අවස්ථාව වන විට පැල ලබාදීමට හැකියාවක් පැවැති අතර වැසි තත්ත්වයේ වැඩි වීම නිසා දෙළුම් පැල සැපයීමේ ධාරිතාවය අඩු වූ බව අපගේ නිගමනයයි. | විනිවිධභාවයෙන් යුක්තව සැපයුම්කරුවන් තෝරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2023 වර්ෂය තුළදී ඉටුකර තිබුණු ප්‍රසම්පාදන කටයුතු 68 ක් සඳහා ප්‍රසම්පාදන කමිටුව රැස්වී තිබුනේ අවම මිල ලබාදී තිබුණු සැපයුම්කරු තෝරා ගැනීමට පමණක් වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යය ආරම්භක අවස්ථාවේ සිට අවසන් කිරීම දක්වා ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් සනාථ කරගත නොහැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.5.1 (ඇ) ඡේදය ප්‍රකාරව ක්‍රියා කිරිම ප්‍රසම්පාදන කමිටුව විධිමත්ව සිදුකලද එම රැස්වීම් සඳහා වාර්තාවන් සකස් කිරිම සිදුකර නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්තමානය වන විට භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නිල නිවාසයක් සහ ගොවිජන සේවා මධ්‍යස්ථානය ලෙස හඳුනා ගන්නා ලද ගොඩනැඟිලි 02 ක් ඵලදායි ආකාරයට භාවිතා කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබීම හේතුවෙන් විනාශ වෙමින් පවතුණි. | දිර්ඝ කාලයක් භාවිතයට ගෙන නොමැති හෙයින් මාදම්පේ නිල නිවාසය අලුත් වැඩියා කල යුතුව ඇත. ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින්ද එම ගොඩනැගිලි අළුත්වැඩියා කර නැත. | නිල නිවාස සහ රජයේ ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීමටත් ප්‍රයෝජනයට ගැනීමටත් අවශ්‍ය කටයුතු කළයුතුය. |
| (ආ) | කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකමේගේ නිල වාහනය ලෙස ලබා දී තිබූ කැබ් රථයේ පූර්ණ එන්ජින් අලුත්වැඩියාව 2021 අගෝස්තු මාසයේදී රු.474,450 ක් වැයකර සිදුකර තිබියදී නොසැළකිළිමත්ව වාහන ධාවනය කිරීම හේතුවෙන් නැවත ක්‍රියා විරහිතව තිබූ අතර, අලුත්වැඩියාව සිදුකළ ගරාජයේ හිමිකරු විසින් මෙම දෝෂ සම්බන්ධයෙන් වගකියනු නොලබන බව දක්වා තිබුණි. | කැබ් රථයේ ඇතිව තිබෙන දුර්වලතාවය පිලිබඳව ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර මූලික විමර්ශනයක් පැවැත්වීමට ක්‍රියා කරන ලෙස ඉල්ලීම් කර ඇත. | රජයේ වාහන ආරක්ෂා කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | නාත්තන්ඩිය නගර සීමාවේ පිහිටි රජයට අයත් හෙක්ටයාර් 3.72 (අක්කර 09 රූඩ 02) විශාල වානිජ වටිනාකමකින් යුතු ඉඩම 2021 වර්ෂයේ සිට වර්ෂ 2.5 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණු අතර, එම භූමිය රජයට ආදායමක් ලැබෙන අයුරින් යොදවා ගැනීම කෙරෙහි වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. මීට පෙර මෙම ඉඩම දීර්ගකාලීන බදු පදනම මත ලබාගෙන තිබුණු පිරාමල් ග්ලාස් සමාගම රජයට අයත් මෙම ඉඩමෙන් ඉවත් කිරීමෙන් පසු එම ආයතනය පවත්වාගෙන ගිය ගොඩනැඟිලි 14 ක් සහ යන්ත්‍ර සූත්‍ර උපකරණ එම භූමියේ නිශ්කාර්යව පවතින බව සහ විනාශ වෙමින් පවතී. | නිශ්කාර්යව ඇති යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැගිලි වෙන්දේසි කිරිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටින අතර දැනටමත් එම භූමියේ කොටසක විදාතා මධ්‍යස්ථානය, බිම්සවිය කාර්යාලය හා විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රාදේශිය මධ්‍යස්ථානය ස්ථාපනය කර ඇති අතර අබිලි කොටස් ඉවත් කිරිමෙන් අනතුරුව මුළු භූමියම ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත. | රජයේ ඉඩම් හා ගොඩනැඟිලිවලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් ආදායම් උපයා ගැනීමටත් අවශ්‍ය කටයුතු කළයුතු බව |

### 3.6 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ හා නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන යටතේ බෙදා හරිනු ලබන සහල් වර්ගය පූර්ව වශයෙන් නිවැරදිව නිශ්චය නොකිරීම හේතුවෙන් ප්‍රතිලාභීන් රතු කැකුළු සහල් ප්‍රතික්ෂේප කිරීම නිසා ඉතිරි වී තිබූ රු.60,800 ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 380 ක් විනාශ කර තිබුණු අතර, රු.650,603 කට සත්ත්ව ආහාර සඳහා වෙන්දේසි කල සහල් කිලෝග්‍රෑම් 8030ක් නිෂ්පාදනය කිරීමට රජය රු.1,317,770 ක් වියදම් දරා තිබූ බැවින් රු.667,166 ක පාඩුවක් ද රජයට සිදුවී තිබුණි. තවද සහල් කිලෝග්‍රෑම් 590 ක ඌනතාවයක් ද නිරීක්ෂණය විය.<br>. | ප්‍රවාහනයේ දී සහල් මළු තෙතමනයට ලක්වීම, ප්‍රතිලාභීන් සහල් භාර නොගැනීම, විධිමත් ගබඩා පහසුකම් කාර්යාල පරිශ්‍රය තුළ නොමැතිවීම ඉතිරි සහල් කඩිනමින් පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රැස්කිරීමට ප්‍රමාද වීම, ඉතිරි සහල් තොගය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගය සම්බන්ධ උපදෙස් 2023 ජූලි 17 දින නිකුත් කිරීම හා සහල් මිනිස් පාරිභෝජනයට නොසුදුසු තත්ත්වයට පත්වී තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. ප්‍රතිලාභීන් රැගෙන යන සහල් සුළු ප්‍රමාණවලින් පාරිභෝජනය කර ඉතිරි ප්‍රමාණය ආපසු බාරදී කිලෝග්‍රෑම් 10 සහල් මළු ලබාදීම හේතුවෙන් තොගයේ බර කිරීමේ දී කිසියම් ප්‍රමාණයක අඩුවක් සිදුවී තිබූ බැවින් ද, මාස 04 කට පසු සහල් වියළීම නිසා බර අඩුවීම සිදුවී ඇත.එම නිසා සහල් තොගයේ වෙනසක් පැවතුණි. | අපේක්ෂිත පරමාර්ථ ඉටුවන පරිදි චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබූ වසර ගණනාවක් පැරණි ගිනි අවි 20 ක් 2024 පෙබරවාරි වනවිටත්, තක්සේරු මණ්ඩලයක් මඟින් තක්සේරු කිරීම සඳහා වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණ අතර, 2017 වසරෙන් පසුව ගිනි අවි තක්සේරු කිරීම් කටයුතු වාර 04 ක් පවත්වා තිබුණ ද, මෙම ගිනි අවි තොගය එම තක්සේරු කිරීම් සඳහා ඇතුළත් කරගෙන නොතිබුණි. | එම ගිනිඅවි 20 භාරගෙන නැවත අයිතිකරු වෙත ලබා දෙනතුරු සුරක්ෂිතාගාරයේ තැන්පත් කර ඇති බවට සටහන් යෙදි තිබූ බැවින් එම ගිනිඅවි තක්සේරු කර නොතිබුණි. | තක්සේරු කර නොමැති ගිනි අවි තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළයුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන වැඩ විෂයයන් සඳහා බොරළු කියුබ් ඒකක ස්ථානීය මිල (පැටවීම හා රාජ්‍ය | 2021 වර්ෂයේ පළමු අර්ධය සඳහා මිල කමිටුව පවත්වා මිල ගණන් නිශ්චය කළ අතර, මෙම ව්‍යාපෘති පළාත් පාලන ආයතන මගින් සිදු කළ අතර ඔවුන් | වැඩිපුර ගෙවීම් කරන ලද මුදල අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | භාගයා ඇතුළත්ව) රු.3,000 ක් වන පළාත් මිල කමිටුවේ ස්ථානීය මිල භාවිතා කර තිබුණු ද , පුත්තලම් දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/TFC/CS/01/මි.ක/(1)/2021 හා 2021 ජනවාරි 01 දිනැති දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව බොරළු කියුබ් එකක් පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව ස්ථානීය මිල රු.2,000 ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ව්‍යාපෘති 89 ක් සඳහා භාවිතා කරන ලද බොරළු ඝන මීටර් 7482.8 ක් හෙවත් කියුබ් 2641.3 ක් භාවිතා කිරීමේ දී කියුබ් එකකින් රු.1,000 ක් බැගින් රු.2,641,300 ක අලාභයක් සිදුවී තිබුණි. | පළාත් මිල කමිටු වාර්තා භාවිතා කරන බැවින් ද පළාත් මිල කමිටුවල අගයන් දිස්ත්‍රික් මිල ගණන්වලට වඩා වැඩි බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඇස්තමේන්තු මත ව්‍යාපෘති ඉටුකිරීමට කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ෂේප කළ බැවින් පළාත් මිල ගණන් යොදා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත වාචිකව දන්වා ඇති බව, ඒ අනුව වැඩිපුර ගෙවීමක් සිදුවී නැත. | කටයුතු කළ යුතුය. |
| (ඈ) | කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කන්දකුලිය ට්‍රාන්ස්ෆෝමර් සිට මුස්ලිම් විදුහලට යන පාර තාර දැමීම ගෙවීම් වාර්තාව අනුව මාර්ගයේ තාර දැමූ කොටස 361.46 $m^2$ ක් ලෙස මිනුම්ගෙන ගෙවීම් කර තිබුණද, භෞතිකව නිරීක්ෂණය වූයේ 334.8 $m^2$ බැවින්, 26.66 $m^2$ කට රු.2,715 බැගින් රු.72,373 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ සංවර්ධනය කිරීමේ දී කොටසක් යටවී ඇති අතර පාසැල් ගේට්ටුව සකස් කිරීමේ දී ද කොටසක් විනාශ වී ඇත. ඒ අනුව 361.46$m^2$ තාරදැමූ කොටසට ගෙවීම් කිරීමේ දී මිනුම් ප්‍රමාණ නිවැරදිවේ. | වැඩිපුර ගෙවීම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතුය |
| (ඉ) | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහනගම ක්‍රීඩාංගනය වටා ආරක්ෂිත වැටක් (වෙන්ලින්ක්දැල) ඉදිකිරීම ලෙස රු.960,700 ක් වියදම් කර තිබුණ ද, එතුලින් ක්‍රීඩාංගනයේ ආරක්ෂාව හෝ අනවසර අල්ලා ගැනීම්වලට ස්ථිර විසඳුමක් නොවූ අතර නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | භූමියේ සීමාව ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ඉදිකළ ආරක්ෂිත වැට, මුල් අවස්ථාවේ තිබූ අයුරින්ම මේවන විටත් පවතින අතර කවුළු ඉදි කිරීම තුළින් ව්‍යාපෘතියේ අරමුණට හානියක් වී නොමැත.<br><br>එමෙන්ම වැට සකස් කිරීම සඳහා, අනවශ්‍ය පිරිවැයක් දරා නොමැත. වැට ඉදිකිරීම සඳහා අත්තිවාරම් ද දමා නැත.පොළොවෙන් 1.5m ක් උසට සිටින සේ GI බට සිටුවා, ඒ වටා කොන්ක්‍රීට් කර, දැල ගසා ඇත.මෙය නාගරික ප්‍රදේශයක ඇති ක්‍රීඩා පිටියක් බැවින් හා නිතර නිතර ක්‍රිඩා කටයුතු සිදු වන බැවින් ඒ වටා කම්බි ගැසීම ප්‍රායෝගික නොවන බව ද දන්වා සිටිමි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කලයුතුය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාම ශක්ති පලමු සහ දෙවන අදියර යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අයත් සමිති 166න් සමිති 121 ක් අක්‍රීයව පවතින අතර මෙම සමිතිවල 2023 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.102,385,768 ක මුදල් ශේෂයක් නිශ්කාර්යව පැවතුණි. | වර්තමානය වන විට සෞභාග්‍ය සංවර්ධන කාර්යංශය යටතේ ග්‍රාම ශක්ති සමිති ක්‍රියාකාරිත්ව මෙහෙයවන අතර අක්‍රිය ග්‍රාම ශක්ති සමිති සතු අරමුදල් සක්‍රිය සමිති වෙත ලබාදී ජනතාවන්හි ජීවනෝපාය සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩ සටහන් ශක්තිමත් කිරිමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථ ඉටුවන ආකාරයට කටයුතු කළයුතුය. |
| (ආ) | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාශයේ මූල්‍ය ප්‍රතිපාදනවලින් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ මහ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ග්‍රාමීය කාන්තාවන් ආදායම් උත්පාදන මාර්ගවලට යොමු කිරීම හා ආදායම් උත්පාදන මාර්ගවල නියැලි සිටින කාන්තාවන් තවදුරටත් දිරිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු චක්‍රීය ණය වැඩසටහනට අදාල ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි පවත්වාගෙන යනු ලබන චක්‍රීය ණය අරමුදල් ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.1,620,000 ක් එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු වෙනුවෙන් යොදා නොගෙන බැංකු ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි. | චක්‍රිය ණය ලබා දීමේ දීපවතින කොන්දේසි අනෙකුත් සමිති වලින් ණය ලබා ගැනීමේ දී පවතින කොන්දේසිවලට සාපේක්ෂව දැඩි බවකින් යුක්තවීම හා අනෙකුත් සමිතියකින් ලබා ගත හැකි ණය මුදලට සාපේක්ෂව ඊට වඩා අඩු ණය මුදලක් චක්‍රීය ණය වලින් ලබා ගැනීමට සිදු වීම නිසා කාන්තාවන් අතර මෙම චක්‍රීය ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අවම මට්ටමක පැවතුනි.උක්ත සඳහන් ගැටලු ඒ ආකාරයෙන් ම පවතින අතරතුර යම් සාධනීය මට්ටමකින් චක්‍රීය ණය වැඩ සටහන ක්‍රියාත්මක කරමින් ඇති බව දන්වමි | ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථ ඉටුවන ආකාරයට කටයුතු කළයුතුය. |
| (ඇ) | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රජයට අයත් ඉඩම් අක්කර 62.5 ක ප්‍රමාණයක් විවිධ පුද්ගලයින් විසින් අනවසරයෙන් අල්ලාගෙන තිබුණු අතර මෙම ඉඩම් නැවත රජය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයට අයත් ඉඩම් අක්කර 62.5 ක ප්‍රමාණයක් පුද්ගලයින් තුන්දෙනෙකු විසින් අනවසරයෙන් අල්ලාගෙන තිබූ අතර මෙම ඉඩම් නැවත රජය වෙත පවරා ගැනීම වෙනුවෙන් එක් පුද්ගලයෙකු අල්ලාගෙන ඇති අක්කර 16 ඉඩම දීර්ඝකාලීන බදුදීම සඳහා සළකා බැලීමටද, අක්කර 1 ½ ක කොටස අල්ලාගෙන හිටි පුද්ගලයා එයින් ඉවත්ව ඇත. අක්කර 02 ක කොටස අල්ලාගත් පුද්ගලයා ඉඩමෙන් ඉවත්වී නොමැති බැවින් නඩු ගොනු කිරීමට නියමිතය. අක්කර 43 ක් අල්ලාගෙන ඇති පුද්ගලයාට නඩු පවරා ඇත. | ඉඩම් නැවත රජයට පවරා ගැනීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හලාවත ජල සම්පාදන ක්‍රමය සඳහා පොල් මැස්සවත්ත නමැති ඉඩමෙන් එකතුව හෙක්ටයාර් 0.030 ක ඉඩම් කැබලි 02 ක් රජයට අත්පත් කර ගැනීමේ දී ව්‍යාජ හිමිකම් ඉදිරිපත් කළ පුද්ගලයෙකුට රු.1,000,000 ක වන්දි මුදලක් ගෙවා තිබුණු අතර, පසුව නියම හිමිකරු ඉදිරිපත් වී ලබාගත් නඩු තීන්දුවකට අනුව ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල නියම හිමිකරු ලබාගෙන තිබුණි. | 2006 අගෝස්තු 04 දිනැති ගැසට් නිවේදනය අනුව 2006 සැප්තැම්බර් 29 දින හිමිකම් පරීක්ෂණයට ඉදිරිපත් වී ඇත්තේ එක් පුද්ගලයෙකු පමණි. ඔහු ඉදිරිපත් කළ ලේඛන මත පනතේ 10(1)අ වගන්තිය ප්‍රකාරව ඔහුට වන්දි මුදල් ගෙවා ඇත. නියම හිමිකරු අදාල කාලසීමාව තුළදී ඉදිරිපත් වී නොමැති බැවින් ඔහුගේ අයිතිවාසිකම් සළකා බැලීමට පනතේ ප්‍රතිපාදන නොමැත. පසුව ඔහු විසින් නඩුවක් ගොනුකර ඇත. එම නඩු තීන්දුව මත ගෙවිය යුතු පොලී මුදල නියම හිමිකරු (දේවාලයේ පූජකතුමා) වෙත ගෙවා ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඉ) | කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සෞභාග්‍යා සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩ සටහන - 2021 යටතේ 2021 හා 2022 වර්ෂවල එකතුව රු.6,837,484 වැයකර ඉදිකර තිබූ කන්දකුලිය අගය එකතු කල කරවල නිෂ්පාදන ගම්මානය 2023 දෙසැම්බර් 31 දින වනවිට ද කරවල වේලීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.<br>එසේම දැල් වැට සඳහා යොදා තිබූ 25 mm GI බටවල නිසි පරිදි තීන්ත ආලේප කර නොතිබීම හා බට සම්බන්ධ වන ස්ථානවලට යොදා තිබූ PVC කොටස් ගැලවී ගොස් තිබූ බැවින්, බට තුලට ජලය යාම නිසා බට මළබැඳ තිබුණි. එසේම රු.50,000 ක් වැය කල ගේට්ටු පියන් දෙක හා රු.113,388 ක් වැයකල ජලනල උපකරණ කඩා දමා විනාශ කර තිබුණු අතර රු.29,850 ක් ගෙවා තිබූ අඟල් 1 ½ PVC Gate value 25 ක් සවිකර නොතිබුණි | රට තුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වයෙන් මෙම ව්‍යාපෘතිය මේවන විට අක්‍රීය මට්ටමේ පවතින අතර අදාල සමිතිය සමඟ මේ වනවිට සාකච්ඡා පවත්වා ඇත. තීන්ත ආලේප කර අවශ්‍ය උපාංග සවිකර තිබුණද ක්‍රීඩාපිටියට පැමිණෙන පිරිස් අනවසරයෙන් ඇතුල් වී විනාශ කර ඇත. දැනට අඩුපාඩු නිවැරදි කර ඇත. ගේට්වැල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය භාරයේ තබා ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළයුතුය. |
| (ඊ) | ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැගිල්ලේ 14 වන බිල්පත ගෙවීම් ප්‍රතික්ශේෂ කර තිබූ අතර, බේරුම් කරන ක්‍රියාවලියකට ගොස් 14 වන බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොලී ලෙස රු.10,349,580 ක් ගෙවීමට සිදුවී තිබුණි. | ඉදි කිරීමේ පැවති අඩුපාඩු මත එවකට සිටි නිලධාරීන් විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා කර ඇත. ඒ අනුව, ආරවුල් විනිශ්චය මණ්ඩල ක්‍රියාවලිය, බේරුම්කරණ ක්‍රියාවලියට යාම හේතුවෙන් මෙම ගෙවීම් ප්‍රමාද වූ අතර බේරුම්කරණයේ තීරණය අනුව මෙම ගෙවීම් සිදු කරන ලදී. එම නිසා මෙම ප්‍රමාද පොලී ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට සිදුවිය. | 14 වන බිල්පත ගෙවීම ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු නොකිරීමෙන් පොලී ගෙවීමට සිදුවී තිබූ බැවින්, ඒ පිළිබඳ වගකීම් නිශ්චය කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වර්තමාන තක්සේරු වටිනාකම රු.255,800,000 ක් වූ නිල නිවාස 08 ක් පිහිටි අක්කර 01 යි රූඩ් 02 යි, පර්චස් 14.7 ක් වූ ඉඩම පුත්තලම නගර සභාව විසින් ඉදිකරනු ලබන ඇල්ෆා වෙළඳ සංකීර්ණය හා එහි රථවාහන අංගනය සඳහා පුත්තලම නගර සභාවට පවරා ගෙන ඒ වෙනුවට පුත්තලම ඩිපෝව අංගනය අසල නගර සභාවට අයත් ඉඩමෙන් අක්කර 01 ක් ලබාදී, නිල නිවාස 08 හි වර්තමාන තක්සේරු වටිනාකමට සමාන නිල නිවාස 04 ක් ඉදිකිරීමට අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදීමට එකඟතාවය ලබාගෙන තිබුණි. එහෙත් පුද්ගලයින්ට පදිංචියට සුදුසු තත්ත්වයේ ඇති මෙම නිල නිවාස 08 න් 04 ක් තක්සේරු කිරීමටත් පෙර කඩා ඉවත් කර තිබුණ ද, 2024 මාර්තු වන විටත් ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර තීරණය කරගත් පරිදි නිල නිවාස 04හි ඉදිකිරීම් කටයුතුද ආරම්භ කර නොතිබුණි. | 2023.06.07 දින අදාළ පාර්ශව සමග විශේෂ සාකච්ඡාවක් පවත්වා ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන තීරණ ගෙන ඇත. නව නිල නිවාස 04 ඉදිකිරිමට අවශ්‍ය ඇස්තමේන්තු 2023.09.20 පුත්තලම නගර සභාවේ ලේකම් වෙත යොමු කර ඇත. | ප්‍රමාදයකින් තොරව ඉඩම් ලබාගෙන සැලසුම් කල පරිදි කටයුතු කළයුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 12 කට අදාලව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 23 ක් ද එක් තනතුරකට අදාලව නිලධාරීන් 09 කගේ අතිරික්තයක් විය. | අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු 02 නකු හා ප්‍රාදේශිය ලේකම්වරුන්ද ඇතුලත්ව නිලධාරින් ඌනතාවන් පවතින විට රාජකාරි අඛණ්ඩව සිදුකරමින් සිටින බව දන්වමි. | පවතින අතිරික්ත හා පුරප්පාඩු තනතුරු සම්බන්දයෙන් අවශ්‍ය කටයුතු කළයුතුය. |
| (ආ) | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 13 කට අදාලව පුරප්පාඩු 314 ක් සහ සංවර්ධන නිලධාරි තනතුරට අදාලව නිලධාරීන් 116 ක අතිරික්තයක් විය. | නිලධාරින් අතිරික්ත ලෙස සඳහන් වන්නේ සංවර්ධන නිලධාරි සේවයේ පවතින අතිරික්තයයි. සංවර්ධන නිලධාරි තනතුරු 204 ක් අනුමත කර ගැනිමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. එය අනුමත කල පසු නිලධාරි අතිරික්තය නොපවතින බව ත් ඌනතාවයක් පවතින බවත් දන්වමි. | |